පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 6

# දෙවන වාර පරීක්ෂණය - 2019

පාසලේ නම : ..................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ..................................................

කාලය : පැය 02 යි.

## ඉතිහාසය I , II

### ඉතිහාසය - I

**සැලකිය යුතුයි :**

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

▪ **ප්‍රශ්න අංක01 - 05 දක්වා ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ශ්‍රී ලංකාවේ පැරණිතම සාහිත්‍යමය මූලාශ්‍රය වන්නේ,

1) මහා වංශය 2) දීපවංශය 3) බෝධිවංශය

02. මහසෙන් රජුගේ පාලන කාලය ආරම්භ වූයේ,

1) ක්‍රිස්තු වර්ෂ 274 දීය. 2) ක්‍රිස්තු වර්ෂ 67 දීය. 3) ක්‍රිස්තු වර්ෂ 1 දීය.

03. මිනිසෙකු වීමට නැඹුරුවක් ඇති කළ පැරණිතම වානරයා හඳුන්වන්නේ,

1) හෝමෝ හැබිලස් ලෙසය.

2) ඔස්ට්‍රලෝපිතිකස් ලෙසය.

3) හොමෝ ඉරෙක්ටස් ලෙසය.

04. වෙඩි බෙහෙත් ලොවට හඳුන්වා දෙනු ලැබූ ශිෂ්ටාචාරය කුමක් ද ?

1) මායා ශිෂ්ටාචාරය

2) මෙසපොතේමියානු ශිෂ්ටාචාරය

3) චීන ශිෂ්ටාචාරය

05. පෘථිවියේ අධික ශීතල දේශගුණය උණුසුම් වී පසුව ආරම්භ වූ සාරවත් යුගය හැඳින්වෙන්නේ,

1) සිලූරියන් යුගය ලෙසය.

2) මහා හිම යුගය ලෙසය.

3) හොලෝසින යුගය ලෙසය.



Education NCP - www.edncp.lk
LIVEWORKSHEETS

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්න වල හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර ඉදිරියේ ඇති වරහන තුළින් තෝරා ලියන්න.**

06. අප ජීවත්වන පෘථිවි ගෝලයේ මැද කොටස ............................................ ක් පමණ උෂ්ණත්වයකින් යුක්ත වේ.

( සෙල්සියස් අංශක 6000 / සෙල්සියස් අංශක 600 )

07. පොළොන්නරු ගල් විහාරය ......................................................... රජතුමා විසින් ඉදිකරන ලදී.

( පළමුවන පරාක්‍රමබාහු / මහසෙන් )

08. මහම්මත්තුමා මක්කම සිට මදීනා නගරයට පැමිණි වර්ෂය මුල්කරගෙන .......................... වර්ෂ ආරම්භ වී ඇත.

( ශක / හිජ්රි )

09. මුහුදු පතුලේ ජීවත් වූ ආහාර ගැනීමට මුඛයක් හා ඇස් පහකින් යුතු ජීවයා ........................................... ලෙස හැඳින්වේ.

( ඔපබිනියා / ප්‍රොකායෝට් )

10. මිනිසා විසින් පළමු වරට ගින්දර භාවිතා කළ බවට සාක්ෂි ............................................... හමුවේ.

( ඊශ්‍රාලයෙන් / කැනඩාවෙන් )

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට පහත 'අ' තීරයට ගැලපෙන පිළිතුර 'ආ' තීරයෙන් ගළපා ඊට අදාළ අක්ෂරය ඉදිරියේ ඇති තිත් ඉරි මත ලියන්න.**

| | 'අ' තීරය | | | 'ආ' තීරය |
|---|---|---|---|---|
| 11. | ලෝකයේ පැරණිම අක්ෂර පද්ධතිය අයත් වන්නේ | (..........) | A. | ඉන්දු නිම්න ශිෂ්ටාචාරය |
| 12. | පිළිස්සූ මැටි ගඩොල් භාවිතා කර නිවාස සාදා ගැනීම | (..........) | B. | මායා ශිෂ්ටාචාරය |
| 13. | ලෝකයේ පැරණිම නීති පොත සකස් කර ඇත්තේ | (..........) | C. | හමුරාබි |
| 14. | මුල් වරට රබර් බෝලය සොයා ගත්තේ | (..........) | D. | පාරාවෝ |
| 15. | ඊජිප්තු ශිෂ්ටාචාරයේ රජ පෙළපත හඳුන්වා ඇත්තේ | (..........) | E. | චීන ශිෂ්ටාචාරය |
| | | | F. | මෙසපොතේමියානු ශිෂ්ටාචාරය |



Education NCP - www.edncp.lk
LIVEWORKSHEETS

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ඇති ප්‍රශ්න වලට අදාළ ප්‍රකාශයන් නිවැරදි නම් ( ✓) ලකුණ ද, වැරදි නම් ( ✗) ලකුණ ද, ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

16. මහා හිම යුගයේ දී මැමත් අලි ජීවත් විය. (..........)
17. ලෝකයේ මුලින්ම ජීවීන් බිහිවූයේ ගොඩබිමෙහි ය. (..........)
18. ගිනිකඳු පුපුරන විට ඉන් පිටතට "ලාවා" ගලා එයි. (..........)
19. ඇසිරියන්වරු මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ දක්ෂ වෙළඳුන් ය. (..........)
20. තම්බපණ්ණිය ලංකාවේ නැගෙනහිර වෙරළේ පිහිටා ඇත. (..........)

(ල. 20 × 2 = 40)

Education NCP - www.edncp.lk

***



LIVEWORKSHEETS